(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 75.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2019 ජූලි 10 වැනි බදාදා පූ.භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

40/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනාධිපතිවරණ සමයේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ විශාල ප්‍රමාණයේ (අඩි 20x30) මැතිවරණ ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණය මෙතෙක් අවසන් නොවීමට හේතු කවරේද;

(ii) මෙම පරීක්ෂණ කඩිනම් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) රාජ්‍ය ආයතන තුළ මැතිවරණ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම වැනි දූෂණ ක්‍රියාවන් සම්බන්ධයෙන් පරීක්ෂණ ඉදිරියේදීත් මන්දගාමීව සිදු වීම වළක්වාලීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

91/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට ටින් මාලු ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) එම ටින් මාලු ආනයනය කරනු ලබන මෙරට සමාගම් කවරේද;

(iii) 2018 වර්ෂය තුළ පරිභෝජනයට නුසුදුසු ටින් මාලු ආනයනය කළ අවස්ථා කවරේද;

(iv) එම ටින්මාලු ආනයනය කළ සමාගම් සහ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) අදාළ ආනයන කටයුතු සඳහා පාරිභෝගික සේවා අධිකාරියේ අවසරය ලබා දී තිබේද;

(vi) ආනයනය කළ භාවිතයට නුසුදුසු ටින් මාලු සඳහා ගනු ලබන පියවර කවරේද;

(vii) ඊට පෙර අවස්ථාවලදීද පරිභෝජනයට නුසුදුසු ටින් මාලු ආනයනය කර තිබේ නම්, එම අවස්ථාවලදී ආනයනය කළ සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

148/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් දැනට දරන තනතුරු කවරේද;

(iii) මෙම සේවකයන් 06/2006 චක්‍රලේඛය මඟින් බඳවා ගත්තද, ඔවුන්ට නියමිත උසස්වීම් මේ දක්වා ලැබී නොමැති බව දන්නේද;

(iv) මෙම සේවකයන්ගේ ගැටලු විසඳීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

225/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1999.07.02 දිනැති අංක 1086/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව පදනම් කර ගනිමින් 2005 වර්ෂයේ ගැසට් කර 2006 වර්ෂයේ තරඟ විභාගයක් පවත්වා, ඉන් සමත් වූ නිලධාරින් කොටසකට 2009.11.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුහල්පති පත්වීම් ලබාදී ඇති බවත්;

(ii) එම තරඟ විභාගය පදනම් කරගනු ලැබූ අංක 212/2010/FR දරන හා 2012.01.26 දිනැති නඩු තීන්දුවට අනුව වර්ෂ 2010, 2012 සහ 2014 දී විදුහල්පති තනතුරු ලබා දී ඇති බවත්;

(iii) මෙම පත්වීම් 1999.07.02 දිනැති අංක 1086/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ලබා දී ඇතත් උසස්වීම් ලබා දීමේදී 2014.10.22 දිනැති අංක 1885/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නව ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අදාළ කොන්දේසි පදනම් කර ගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙලෙස එකම විභාගයකට මුහුණ දුන් පිරිසකට වසර ගණනාවක් තිස්සේ වරින් වර පත්වීම් ලබා දීම අසාධාරණ බවත්;

(ii) මෙලෙස උසස්වීම් ලබා දීමට කටයුතු කිරීමේදී නව සේවා ව්‍යවස්ථාව පදනම් කරගැනීමෙන් අතීතයට බලපාන පරිදි නව කොන්දේසිවලට යටත් කිරීම අසාධාරණ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

266/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

434/'19

ගරු කනක හේරත් මහතා,— සංචාරක සංවර්ධන, වනජීවි සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්, එම ආයතනය මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබාදෙන බවත් දන්නේද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි විදේශීය සංචාරකයන් සංඛ්‍යාව, එක් එක් කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට 2018 දක්වා එමඟින් ලැබුණු ආදායම එක් එක් වර්ෂය සහ කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා අවස්ථාවක් ලබා දීම මේ වනවිට නවතා තිබේ නම්, එයට හේතු කවරේද;

(ii) ඒ හේතුවෙන් ආයතනය වාර්ෂිකව ලබන අලාභය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට වටිනා සම්පතක් වන පින්නවල අලි අනාථාගාරය වැඩිදියුණු කිරීම සඳහා රජය මඟින් යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

455/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගයේ, කුරුණෑගල සිට ගලගෙදර දක්වා ඉදිවෙන කොටසේ,

(i) සමස්ත දුර ප්‍රමාණය;

(ii) ඇස්තමේන්තුගත මුළු වියදම;

(iii) පිවිසුම් හා පිටවීමේ දොරටු ස්ථාපනය වන ස්ථාන;

(iv) ඉදිකිරීම් ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධිවේගී මාර්ගයේ ඉහත කොටස සඳහා මේ දක්වා,

(i) පවරා ගත් ඉඩම් ප්‍රමාණය;

(ii) ගෙවා ඇති මුළු වන්දි මුදල;

(iii) ගෙවීමට ඇති වන්දි මුදල් ප්‍රමාණය;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

572/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සතුව ආපදා කළමනාකරණ සැලැස්මක් තිබේද;

(ii) එසේ නොමැති නම්, එයට හේතුව කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයට හදිසි තත්ත්වයකදී කටයුතු අඛණ්ඩව ගෙන යාම සඳහා වූ සැලැස්මක් (Business Continuity Plan) තිබේද;

(iv) එසේ නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

පා. 62/'19

ගරු අනුර දිසානායක මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංගත්වය,— වර්ෂ 2019 අප්‍රේල් 21 වැනි පාස්කු ඉරිදා දින කොළඹ, මීගමුව සහ මඩකලපුව යන ප්‍රදේශවල සිදු වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ඇතුළු දෙසිය පනහකට අධික පිරිසක් ඝාතනය වීමත්, තවත් පන්සීයයකට ආසන්න පිරිසක් තුවාල ලැබීමත් සහ එකී බෝම්බ ප්‍රහාර හේතුවෙන් වූ දේපළ හානිය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් නිසි තොරතුරු ලැබී තිබියදී සාපරාධී නොසැලකිල්ලෙන් පහත සඳහන් කෙරෙන ක්‍රියාවන් කරමින් හෝ නොකර හැරීමෙන් ද:—

(අ) 2019.05.08 වැනි දින අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ පරිදි 2014 වර්ෂයේ සිට අයිඑස්අයිඑස් (ISIS) ජාත්‍යන්තර ඉස්ලාම් අන්තවාදී සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ පිරිස් විවිධ සබඳතා පැවැත්වූ බවත්, විවිධ ක්‍රියාකාරකම්වල යෙදුන බවත් දැන සිටියදී ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට අපොහොසත් වීම;

(ආ) විවිධ ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන මුස්ලිම් සමාජය තුළ ක්‍රියාත්මක වන බවට මුස්ලිම් ප්‍රජාව විසින්ම විවිධාකාරයෙන් ආණ්ඩුව සහ වගකිව යුතු ආයතන දැනුවත් කර තිබියදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම;

(ඇ) කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විවිධ අවස්ථාවල එල්ල කරන ලද තර්ජන සහ ප්‍රහාර සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 21 වැනි දින බෝම්බ පුපුරවාගෙන මිය ගිය සහරාන් හෂීම් සහ 2019 අප්‍රේල් 26 වැනි දින සයින්දමරුදුහිදී බෝම්බ පුපුරුවාගෙන මිය ගිය ඒ. එල්. එම්. නියාස් යන අයවලුන්ට එරෙහිව අධිකරණය විසින් වරෙන්තු නිකුත් කර තිබියදී සහ එකී වරෙන්තුකරුවන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ප්‍රසිද්ධව විවිධ ක්‍රියාකාරකම්වල යෙදී සිටියදී ඔවුන් අත්අඩංගුවට ගැනීමට හෝ නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම;

(ඈ) වර්ෂ 2018 දෙසැම්බර් 24 වැනි දින මාවනැල්ලේ දී බුද්ධ ප්‍රතිමාවන්ට හානි කිරීම සම්බන්ධයෙන් සහරාන් හෂීම් ප්‍රමුඛ කණ්ඩායමක් සම්බන්ධ බවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විසින් ජාතික බුද්ධි අංශය වෙත 2018 දෙසැම්බර් 28 වැනි දින දැනුම් දී තිබියදීත්, හා මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් සැක කරමින් කිහිපදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබියදීත් විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යාම වළක්වමින් ඒ සඳහා මැදිහත් වීම් තිබුණු බව ආණ්ඩුවේ අමාත්‍යවරයෙකු විසින්ම ප්‍රකාශ කර තිබීම;

(ඉ) මෙම ප්‍රහාරයන්ට සැලකිය යුතු කාලයකට පෙර සිට ශ්‍රී ලංකාව තුළ ඉස්ලාම් අන්තවාදී සංවිධානවල විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂයෙන් සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් අයිඑස්අයිඑස් (ISIS) සංවිධානය සමඟ බැඳී කටයුතු කිරීම ඇතුළු කරුණු සම්බන්ධයෙන් නීතිමය සහ ආරක්ෂක පියවර ගැනීමට අපොහොසත් වීම;

(ඊ) ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අග්‍රාමාත්‍යවරයා ආරක්ෂක මණ්ඩල සභාවාරයන්ට සහභාගි නොවීමෙන් රටවැසියා වෙත ඔහු විසින් ඉටු කළ යුතු මූලික වගකීම් පැහැර හැරීම;

(උ) විදේශීය ඔත්තු සේවාවන් විසින් ශ්‍රී ලංකාව තුළ කතෝලික දේවස්ථාන හා හෝටල් ඉලක්ක කරගෙන මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කෙරෙන බවත්, එයට සම්බන්ධ පුද්ගලයන් හා ඔවුන්ගේ දුරකථන අංක, ජාතික හැඳුනුම්පත් අංක ඇතුළු නිශ්චිත තොරතුරු ලබා දී තිබියදී එම තොරතුරු මත පදනම්ව කටයුතු කිරීම පැහැර හැරීම;

වැඩිමනත් ලෙස 2019.04.21 වැනි දින ප්‍රහාරයන්ට පෙර අදාළ විදේශ ඔත්තු සේවාවන් විසින් නැවතත් මෙම ප්‍රහාරයන් සම්බන්ධයෙන් නිශ්චිතව අනතුරු අඟවා තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පැහැර හැරීම;

(ඒ) 2019.04.11 වැනි දින නියෝජ්‍ය පොලිස්පති, විශේෂ ආරක්ෂක දිසාව ප්‍රියලාල් දසනායක මහතා විසින් ''Information of an alleged plan attack'' යන ශීර්ෂය හා අංක DIG/SPR/126/4.19 දරන ලිපිය මඟින් 2019 අප්‍රේල් 21 වැනි දින නිශ්චිත ස්ථාන ඉලක්ක කරගෙන සැලසුම්ගත මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ලවන බවට, එනම් ''ජාතික තව්හිත් ජමාත් නායක මොහොමඩ් සහරාන් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරක් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව මඟින් ලබා දී තිබූ වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින්'' යනුවෙන් සඳහන් ලිපිය පහත නම් සඳහන් එනම්,

- අධ්‍යක්ෂ/ඇමති ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂ / අධිකරණ ආරක්ෂක කොට්ඨාසය
- අධ්‍යක්ෂ / විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය
- වැඩ බලන අධ්‍යක්ෂ/තානාපති ආරක්ෂක කොට්ඨාසය (iv)
- වැඩ බලන අධ්‍යක්ෂ/ විශ්‍රාමික ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය (v)

අයවලුන්ට පූර්වයෙන් ලබා දී තිබීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම පැහැර හැරීම, යන ඉහත කරුණු අනුව 2019.04.21 වැනි දින සිවිල් වැසියන් ඉලක්ක කරගනිමින් සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය අවශ්‍යයෙන්ම වළකා ගැනීමට හෝ හානිය අවම කරගත හැකිව තිබූ හෙයින්ද;

(උ) 2019.04.21 වැනි දින සිදු කරනු ලැබූ ප්‍රහාර මාලාවෙන් පසුව අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍යවරුන් විසින් එකී ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් වූ වගකීම භාර නොගෙන එම වගකීම වෙනත් පාර්ශ්වයන්ට පැවරීමට උත්සාහ කරමින්ද, රජයේ අමාත්‍යවරුන් විසින් වගකීම් විරහිත, පරස්පර සහ සාවද්‍ය ප්‍රකාශයන් සිදු කරමින් රටේ සාමාන්‍ය ජනජීවිතය හා මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් සහ අනාරක්ෂිතභාවයක් ඇති වන පරිදි කටයුතු කර ඇති හෙයින්ද;

(ඌ) 2019.04.21 වැනි පාස්කු ඉරිදා දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාවලියට බාධා කරමින් සහ එකී අපරාධයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කරමින් හෝ වළක්වමින් ආණ්ඩුවේ සමහර අමාත්‍යවරුන් කටයුතුකර ඇති හෙයින්ද;

(ඔ) 2019.04.21 වැනි දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර මාලාවෙන් පසුව තවත් එවැනි ප්‍රහාර මාලාවක් ඇති වීම හෝ වෙනත් ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීම මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පූර්ණ නීති මාලාවක් රාජ්‍යය සතුව තිබියදී 2019.05.13 වැනි දින ගම්පහ ප්‍රදේශයේ සහ වයඹ පළාතේ සිදු වූ අන්තවාදී ප්‍රචණ්ඩකාරී ක්‍රියා, එනම් මනුෂ්‍ය ඝාතන, දේපළ හානි සහ ජනතාව අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා නිසි අවධානයකින් සහ වගකීමෙන් කටයුතු නොකිරිමේ සහ එකී සිද්ධීන් මැඩපැවැත්වීම සඳහා ගතයුතු නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මත ජනතාව සම්බන්ධයෙන් රජය විසින් ඉටුකළ යුතු යුතුකම් වගකීම් නිසි ආකාරයෙන් ඉෂ්ඨ කිරීම පැහැර හැරීමෙන් සහ 2019.04.21 වැනි දින ප්‍රහාර මාලාවෙන් පසුව රටෙහි විවිධ ජනවර්ගයන් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් සහ ප්‍රහාරයන්වලට යොමු වීමේ ප්‍රවණතාවයක් තිබියදී එකී ප්‍රහාරයන් වළක්වා ගැනීමට කටයුතු නොකළ හෙයින්ද;

(ඕ) එකී පාස්කු ඉරිදා දින ප්‍රහාරයෙන් මාසයක් ගතවී තිබියදී, රටෙහි සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද, රටෙහි පාසල් සහ සරසවි අධ්‍යාපන ක්‍රියාවලිය නැවත ගොඩනැගීමට අසමත් වී ඇති හෙයින්ද, රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය නැවත යථා තත්ත්වයට පත් කිරීමට අසමත් වී ඇති හෙයින්ද, ආණ්ඩුවක් වශයෙන් රටෙහි ජනතාව වෙත තමන් විසින් ඉටුකළ යුතු වගකීම් සහ වගවීම් පැහැර හැර ඇති හෙයින්ද; සහ

2019.04.21 වැනි දින ප්‍රහාර මාලාව වැළැක්වීමට අසමත් වූ නිසා මෙන්ම ඉන් පසුවද රටේ ආරක්ෂක තත්ත්වය සහ සිවිල් ජන ජීවිතය යථා තත්ත්වයට පත් නොකිරීම නිසා ඇති වී තිබෙන අරාජික තත්ත්වය මත රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට විදේශ රාජ්‍යයන්ට ඉඩකඩ හරිමින් ක්‍රියා කර ඇති හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව සම්බන්ධයෙන් තවදුරටත් විශ්වාස භංගත්වයට පත්ව ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*2.

රජයේ ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ යෝජනාව,— 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ 3 වගන්තිය යටතේ:—

(අ) මෙහි උපලේඛනයේ විස්තර කරඇති "වරාය නගරය කොළඹ" යනුවෙන් හඳුන්වනු ලබන ගොඩ කරන ලද භූමි ප්‍රදේශය, 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශය සහ සීමා තුළට ඇතුළත් කිරීම මඟින්, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශය සහ සීමා වෙනස් කරනු ලැබිය යුතු බවට; සහ

(ආ) ඒ ගොඩ කරන ලද භූමි ප්‍රදේශය, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එක් කරනු ලැබිය යුතු බවටත්

මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

**උපලේඛනය**

මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2019.06.11 දිනැති අංක CO/DSO/2019/370 දරන අනුරේඛනයේ නිරූපණය කර ඇති, බස්නාහිර පළාතේ කොළඹ, මෙහි පහත දැක්වෙන සම්බන්ධ කිරීමේ ලක්ෂ්‍යයන්හි පිහිටා ඇති සහ කැබලි අංක 2 සිට කැබලි අංක 7 ලෙස සලකුණු කොට ඇති හෙක්ටයාර 446.6153කින් සමන්විත "වරාය නගරය කොළඹ" යනුවෙන් හඳුන්වනු ලබන, පහත දැක්වෙන පරිදි මායිම් වූ භූමි ප්‍රදේශය:—

| **සම්බන්ධ වන ලක්ෂ්‍යය - කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම** | **නැගෙනහිර ඛණ්ඩාංක** | **උතුරු ඛණ්ඩාංක** |
|---|---|---|
| උතුරින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 396913.476 | 492847.764 |
| දකුණින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 397077.037 | 492290.222 |

*(සමුද්දේශ ඛණ්ඩාංක පද්ධතිය: Srilanka Grid 1999)*

**1.** කැබලි අංක **2 :** ප්‍රමාණය හෙක්ටයාර **155.8376**

උතුරට - කැබලි අංක 6 සහ 1, කොළඹ වරාය සහ චෛත්‍යය පාර
නැගෙනහිරට - කැබලි අංක 1, කොළඹ වරාය, චෛත්‍යය පාර, ඉන්දියානු සාගරය සහ කැබලි අංක 7
දකුණට - ඉන්දියානු සාගරය, කැබලි අංක 7, 6 සහ 3
බටහිරට - කැබලි අංක 6, 3 සහ 6

**2.** **කැබලි අංක 3 :** **ප්‍රමාණය හෙක්ටයාර 15.0933**

උතුරට - කැබලි අංක 2
නැගෙනහිරට - කැබලි අංක 2 සහ 6
දකුණට - කැබලි අංක 6 සහ 4
බටහිරට - කැබලි අංක 4 සහ 6

**3.** **කැබලි අංක 4 :** **ප්‍රමාණය හෙක්ටයාර 113.5311**

උතුරට - කැබලි අංක 6 සහ 3
නැගෙනහිරට - කැබලි අංක 3 සහ 6
දකුණට - කැබලි අංක 6, 5 සහ 6
බටහිරට - කැබලි අංක 6, 5 සහ 6

**4.** **කැබලි අංක 5 :** **ප්‍රමාණය හෙක්ටයාර 14.7856**

උතුරට - කැබලි අංක 6 සහ 4
නැගෙනහිරට - කැබලි අංක 6 සහ 4
දකුණට - කැබලි අංක 6
බටහිරට - කැබලි අංක 6

**5.** **කැබලි අංක 6 :** **ප්‍රමාණය හෙක්ටයාර 101.1038**

උතුරට - කැබලි අංක 7, 1, 2, 3, 4, 5, 4, 3 සහ 2
නැගෙනහිරට - කැබලි අංක 1, 2, 3, 4, 5, 2 සහ 7
දකුණට - කැබලි අංක 2 සහ 7
බටහිරට - කැබලි අංක 2 සහ 7

**6.** **කැබලි අංක 7 :** **ප්‍රමාණය හෙක්ටයාර 46.2639**

උතුරට - ඉන්දියානු සාගරය, කැබලි අංක 1, 6 සහ 2
නැගෙනහිරට - කැබලි අංක 1, 6 සහ 2 සහ ඉන්දියානු සාගරය
දකුණට - ඉන්දියානු සාගරය
බටහිරට - ඉන්දියානු සාගරය

*4.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.06.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 05 දිනැති අංක 2113/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.06.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*8.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබා ඇති පක්ෂය වශයෙන් එක්සත් ජාතික පක්ෂය විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවා ඇති බැවින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 48ක් නොඉක්මවිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව 45ක් නොඉක්මවිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබයි.

*15.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 04/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*19.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

21.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

22.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

23.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

24.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

මෝහන් ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

ඡායා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*